# සාරාංශය


මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ වත්මන් අධ්‍යාපන ක්‍රමය තුළ පාසල නැමති ආයතනය තුළ අ.පො.ස. (උසස් පෙළ) සිසුන් මුහුණ දෙන ගැටලු කවරේ ද යන්න හඳුනා ගැනීමත්, එම ගැටලු ඔවුන්ගේ අධ්‍යාපනයට කෙසේ බලපාන්නේද යන්නත් සොයා බැලීමය. තවද එම ගැටලුවලට පාසල් උපදේශන සේවාවකින් කෙසේ සහාය විය හැකි ද යන්න සොයා බැලීමත් මෙහි එක් අරමුණක් විය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු හතරකි. ආයතනික ගැටලු යනු මොනවාද? එම ගැටලු ඇති වීමට බලපාන සාධක කවරේද? එම ගැටලු සිසුන්ගේ ඉගෙනුම කෙරේ කෙසේ බලපායි ද? උපදේශන සේවාවකින් ඒ සඳහා ලද හැකි සහාය කෙබඳුද? යන අරමුණු අනුව අධ්‍යයනය මෙහෙයවිණි.

මෙම අධ්‍යයන වාර්තාව පරිච්ඡේද පහකින් සමන්විත වේ. පළමු පරිච්ඡේදය පර්යේෂණ මාතෘකාව, එනම් ගැටලුව හැඳින්වීම සඳහා වෙන් කරන ලදී. ගැටලුව ඉදිරිපත් කිරීම, අධ්‍යයනයේ පසුබිම, ආයතනික ගැටලු හා එම ගැටලු විමර්ශනයේ වැදගත්කම, ආයතනික ගැටලු ඇතිවන ක්ෂේත්‍ර, ඒවා ඇතිවීමට බලපාන සාධක, පාසල් සංස්කෘතිය, ගුරුවරයාගේ කාර්යභාරය කුමක්ද? යන්න පළමුව විමසුමට ලක් කරන ලදී. අධ්‍යයනය සඳහා යොදාගත් නියැඳියේ සුවිශේෂත්වය, ආයතනික ගැටලු ඉගෙනුම කෙරේ බලපාන ආකාරයත් උපදේශන සේවාවක වැදගත්කම, අද ලංකාවේ පාසල්වල ක්‍රියාත්මක වන උපදේශන සේවයේ ස්වරූපය කෙබඳුද? යන්න පළමු පරිච්ඡේදයෙන් විස්තර කරන ලදී.

ඉහත ගැටලුව සම්බන්ධව මේ දක්වා කර ඇති පර්යේෂණ මොනවාද? පර්යේෂණයන්, එම අධ්‍යයනයන්හි මෙම ගැටලුව සම්බන්ධව සොයාගත් තොරතුරු කවරේද? යන්න විමසුමට ලක් කරන ලදී. ඒ අනුව පාසල සම්බන්ධ ගැටලු, ගුරුවරයාගේ කාර්යභාරය, ඉගෙනීම සහ අධ්‍යාපනික සාධනය, උපදේශනය සහ එහි අවශ්‍යතාව යන උප මාතෘකා යටතේ සිදුකර ඇති පූර්ව විමර්ශණ මෙහි සඳහන් කර ඇත.

අධ්‍යයනය මෙහෙයවූ ආකාරය පිළිබඳ තොරතුරු තුන්වන පරිච්ඡේදයෙන් දැක්වේ. ඒ යටතේ පරිච්ඡේදය හැඳින්වීම, අපේක්ෂිත ජනගහනය, නියැඳිය තෝරාගැනීම, දත්ත රැස් කිරීම සඳහා භාවිත කළ ක්‍රම ශිල්ප, වෙන වෙනම සිසුන්ගේ සහ ගුරුවරුන්ගෙන් දත්ත ලබා ගැනීමට භාවිත කළ ප්‍රශ්නාවලි සැකසීම සඳහා යොදාගත් න්‍යාය යනාදිය තුන්වන පරිච්ඡේදයෙන් දැක්වේ.

පර්යේෂණ කාර්යකදී වැදගත්ම පරිච්ඡේදය හතරවැන්නයි. පර්යේෂණයේ ගැටලුව පැහැදිලි කිරීම සඳහා එකතු කරගත් දත්ත ක්‍රමවත් ලෙස විශ්ලේෂණය කළ යුතුව ඇත. ඒ අනුව මෙම පර්යේෂණයේ හතරවන පරිච්ඡේදයෙන් දත්ත විශ්ලේෂණය සිදුකර ඇත. සිසුන්

මුහුණ දෙන ආයතනික ගැටලු මොනවාද යන්න කැටිකර දක්වා ඇති අතර එක් එක් ගැටලුව සඳහා සිසුන් වෙන වෙනම මුහුණ දුන් ප්‍රමාණය සංඛ්‍යාත්මකව දක්වා ඇත. දෙවනුව එම ගැටලුවලට බලපාන සාධක විශ්ලේෂණය කර ඇත. තෙවනුව එම සාධක ඉගෙනුම කෙරේ බලපා ඇති ආකාරය විමසුමට ලක් කර ඇත. අවසානයේදී උපදේශන සේවාවෙහි වැදගත්කම ඇගයීම සඳහා තෝරාගත් ප්‍රත්‍යෙක අධ්‍යයන හතරක් දක්වා ඇත.

පස්වන පරිච්ඡේදයෙන් පළමුවන යෝජිත අරමුණු තහවුරු කිරීම සඳහාත්, අධ්‍යයනයෙන් ලබාගත් තොරතුරු අනුව එළඹුණු නිගමන විස්තර කර ඇත. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආයතනික ගැටලු ලෙස හඳුනාගත් ගැටලු රාශියකි.

01. ගුරුවරුන්ගේ ඉගැන්වීම් ක්‍රමවල දක්නට ලැබෙන විවිධ අක්‍රමතා
02. ගුරුවරුන්ගේ විෂය පිළිබඳ නිපුනතා මඳ බව.
03. පාසල් විනය, පරිපාලනය හා ගුරුවරුන්ගේ ආකල්ප විෂමතා නිසා ශිෂ්‍යයින්ට ඇති වූ ගැටලු
04. ගුරු ශිෂ්‍ය සම්බන්ධතාවයෙහි දුරස් බව.
05. ගුරුවරුන් සිසුන්ගේ අභ්‍යාස නිසි ලෙස පරීක්ෂා නොකිරීම හා නිවැරදි ඇගයීම් සිදු නොවීම.
06. තරඟකාරී බව හැම ක්ෂේත්‍රයක් පුරාම ප්‍රදර්ශනය වීම හා ඉන් විවේකයට බාධා ඇති වීම.
07. පාසලේ පිහිටීම.
08. පංති කාමරවල ළමුන් අත්විඳින අපහසුතා
09. තමා කැමති විෂයක් තෝරා ගැනීමේදී ඇතිවන විවිධ දුෂ්කරතා
10. පාසල් සංස්කෘතිය
11. සිසුන්ගේ හැසිරීම් රටා, සම වයස් කණ්ඩායම්, භාවිත භාෂාව, විනය යන අංශ වලින් ඇතිවන ගැටලු

එසේම සමස්ථ අධ්‍යාපන ක්‍රමය තුල දක්නට ඇති ගැටලු විස්තර කිරීමත් එම ගැටලු අවම කර ගැනීම සඳහා යෝජනා කිහිපයකුත් ඉදිරිපත් කර ඇත. ඒවා පහත ආකාර වේ.

1) පාසල නැවත සැකසීම.
2) ගුරු අධ්‍යාපනය ප්‍රතිසංවිධානය.
3) සේවයට ඇල්මක් දක්වන පුද්ගලයන් සේවයට පත් කිරීම.
4) සෑම පාසලකම උපදේශන ඒකක පිහිටුවීම.
5) සෑම ගුරුවරයෙකුටම උපදේශනය පිළිබඳ දැනුමක් ලබා දීම.

ඉහත සඳහන් කර ඇති ආකාරයට මෙම අධ්‍යයනය මෙහෙයවා ඇත.